# සසිනි අපේ දරුවනට ආදර්ශයක්



## දර්ශන එදිරිවීර

රොක්ස්බර්ග් පාක් සිංහල භාෂා පාසල, කවදත් අපට ආ ගිය හුරුපුරුදුකම් අති සුහද ලෙන්ගතු අධ්‍යාපනික ආයතනයක්. අද වයසෙන් වැඩී පාසල් දිවියද හමාර කොට සිටින, මා පුතණුවන් සහ දියණිය තවදුරටත් මෙහි ඉගෙනුම නොලැබුවත් දිගු කාල පරාසයකට පෙරාතුව ඔවුන්ගේ පාසැල් වියේදී, නොකඩවා වසර ගණනාවක් දරු දෙදෙනා සති අන්ත සිංහල පන්තියට කැටුව ඒමෙන්, එදා ඇතිවූ ඒ හෘදයාංගම බැඳීම අදටත් එසේමයි. ඒ සම්බන්ධතාව,,

2001 වසරේදී මේ සොඳුරු පාසල හිමාලි කරුණා-සේන මහත්මියගේ සම්බන්ධීකරණ දායකත්වයෙන් ආරම්භ කෙරුනු වකවානුවේ සිටම පැවතගෙන එන්නක්.

එතෙකුදු, කාර් බහුල වූ දින චරියාව ඉදිරියේ සිංහල භාෂා පාසල හා සහසම්බන්ධ ක්‍රියාකාරී සහභාගීත්වය අද මවෙතින් බොහෝදුරට ගිලිහී ගොස් තිබුණත්, ඉකුත් නොවැම්බර් අටවැනි සෙන-සුරාදා එහි පැවැත්වුණු සුවිශේෂී ගුරු දෙගුරු රැස්වීමකට අහඹු ලෙස සහභාගී වීමේ අවස්ථාව, බිරිඳත් මාත් ලැබුවා. සිංහල පාසැලේ පහළ පන්තිවල ඉගෙනුම ලබන දූ දරුවන් සිටින අප ඥාතිවරියකගේ ඉල්ලීම පිට, ඔවුනුත් කැටිව අප එසේ සම්බන්ධ වූ, ඒ විශේෂිත දෙමාපිය රැස්වීම සංවිධානය කරනු ලැබ තිබුනේ, පාසැලේ VCE පන්තිය භාර විපුලි ගුරුතුමිය ප්‍රමුඛ ආචාර්යය මණ්ඩලය විසිනුයි.

සිංහල භාෂාව, VCE විභාග විෂයක් ලෙස හැද-ෑරීම සම්බන්ධයෙන් අප අතර ඇති අවබෝධයත්, ඒ හේතුවෙන් පැතිරී ඇති දුර්මතත් නිසාම, ජය ගැනීමට අසීරු ඉලක්කයක් සේ සළකා බහුතරයක් දෙමවුපියන් හා තරුණ දූ දරුවන් විභාග විසයක් ලෙස සිංහල භාෂාව තෝරා ගැනීමට ඉතා අඩු ප්‍රවණතාවයක් දක්වන බව, අප කවුරුත් පැහැදිලිව දන්නා කරුණක්.

ඒ නිසාම, සිංහල භාෂාව හැදෑරීමේ වැදගත්කම පිළිබඳව, නිවැරදි දැක්මක් ලබාදී ඒ යථාවබෝධය තුළින් සිංහල විෂයය පිළිබඳව ඇති අනියත බිය හා අවිනිශ්චිතභාවය දුරු කිරීමේ ඒකායන පරමාර්ථයෙන් සූදානම් කෙරුනු මේ දෙමාපිය හමුවට, එදා සෑහෙන පිරිසක් එක්රොක් වී සිටිනු පෙනුනා.

ප්‍රශස්ත මට්ටමක පැවති ඒ මාපිය සහභාගීත්වය අපට පැහැදිලි කළේ, පාසලේ ආරම්භක අවධියට වඩා සතුටුදායක නැඹුරුවක් අද අප දෙමාපියන්, දූ දරුවන්ගේ සිංහල අධ්‍යාපනය කෙරේ දක්වන වගයි.

රැස්වීමේ ආරම්භයටත් පෙරාතුවම ඇසදුටු ඒ පසන් සත්‍යයය සිතට දැනෙව්වේ සියුම් සතුටක.

මුලසුන හෙබවූ විෂයානුබද්ධ ප්‍රාදේශීය කළමනාකාරතුමන් ප්‍රමුඛ ආරාධිත අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් යුතුවූ දෙමාපිය හමුව සංවිධානය කර තිබුනේ මනා සැළැස්මක් ඇතිවයි.

සිංහල භාෂාව සම්බන්දයෙන් ක්‍රියාත්මක වන නිවැරදි VCE විභාග ක්‍රමවේදය, සමස්ථ විෂය මාලාව, විභාග ප්‍රශ්නෝතත්ර, ලකුණු ලබා දෙන අනුපිළිවෙල සහ භාෂාමය සුදුසුකම් මත විවර වන විවිධ අනාගත රැකියා ක්ෂේත්‍රයන් ඇතුළු ඉතා වැදගත් කරුණු කාරණා පිළිබඳව මේ රැස්වීමේදී දෙමව්පියන්ට මැනවින් විස්තර කරනු ලැබුනා.

සිංහල භාෂා විෂයය සමත් වීමට අසීරු බවට, ඉන් ලබා දෙන ලකුණු ප්‍රමාණය අවම බවට නොදැනුවත්කම නිසාම දෙමව්පියන් ලෙස අප තුළ වූ යම් යම් ආකල්ප පදනම් විරහිත බව අපටම පසක් කර ගත හැකි වනසේ, වගකීමෙන් යුතුව ඉතා විශ්වාසනීය ව අප මෙහිදී දැනුවත් කෙරුනා.

ගිය වසරේදී විභාගයට පෙනී සිටි දරුවන් දෙ-දෙනෙක් සභාව ඇමතුවා. මෙහි ආදි සිසුවන් වූ, අද වෛද්‍ය වෘත්තියේ නිරත වන එකම පවුලේ දරු දෙපළක්ද මේදින රැස්වීමට පැමිණ සහභාගී වීමට ඉසිඹු නොලද නිසාවෙන් සකස් කොට එවා තිබූ වීඩියෝ පටයක්ද අප ඉදිරියේ ප්‍රදර්ශනය කෙරුනා.

VCE විභාගයේදී සිංහල භාෂාව විෂයට පෙනී සිට සමත්කම් දැක්වූ මේ ආදි සිසු දරුවන් සිව්දෙනාම නිවැරදි තෝරාගැනීමක සතුට සභාව සමග බෙදා හදා ගත්තේ, සිංහල භාෂාව හැදෑරීමේ ප්‍රියජනක අත්දැකීම තම දිවිමගට කොතෙක් ප්‍රයෝජනවත් වීද යන්නත් බාල සොයුරු කැළ වෙනුවෙන් ආදරයෙන් විස්තර කරමින්.

VCE පන්තිය භාර විපුලී ගුරුතුමිය, සිංහල පාසලේ සේවයට එක්වී මේ ගතවෙන්නේ පසළොස් වෙනි අවුරුද්ද. ශ්‍රී ලංකාවේ දීද, ගාල්ලේ මහින්ද විදුහලේ දොළොස් වසරක ගුරු සේවය සපුරා පැමිණි ඇය, පළපුරුදු ගුරු මාතාවක්. මෙරටට සංක්‍රමණය වූ මුල් අවදියේදී පශ්චාත් උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු වසර කිහිපයක් අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධව සේවය කළ ඇය, අද ඒ සියල්ලෙන් ඉවත් වී පූර්ණ කාලීනව කැපවී සිටින්නේ මෙල්බර්න් පුරවරයේ වෙසෙන ශ්‍රී ලාංකීය දූ පුතුන්ගේ සිංහල අධ්‍යාපනය වෙනුවෙන්.

ඒ ඉගැන්වීම සිංහල භාෂා පාසලට පමණක්ම සීමා නොකොට, තම නිවහනේදීම නොමිලේ පවත්වාගෙන යන අමතර පන්ති මගින් දුවා දරුවන්ගේ සිංහල දැනුම වඩ වඩාත් ඔප කරදී, VCE කඩඉමේ ජයග්‍රහණය කරා අප බාල පරපුර මෙහෙයවන්නට ඇය ගන්නා දෘඩතර වෙහෙස ඇත්තෙන්ම ප්‍රශංසන-යයි. අද මේ සංවිධානය කළ වැඩදායි ගුරු දෙගුරු හමුව වෙනුවෙන් ද ඇයට අපේ නොමඳ ස්තුති ප්‍රශංසාව හිමිවිය යුතුමයි.

ඊළගට මා ඔබ හමුවේ තබන්නේ, මේ විශේෂිත දෙමාපිය රැස්වීමේ පොදු අරමුණ කරා, වඩාත්ම මා සිත සංවේදී කළ සුපසන් අවස්ථාවක්.

විපුලි ගුරුතුමියගේ ඇණැවුමෙන් එක්තරා අපූරු දියණියක් සභාව ඉදිරියට පියමැන්නා. ශ්‍රී ලංකීය මා පිය යුවළකගේ කණිටු දියණිය ලෙස ඕස්ට්‍රේලියාවේදී උපත ලැබූ ඇය, සසිනී පෙරේරා නමින් අප සැමට හඳුන්වා දෙනු ලැබුවා.

2015 වසරේදී VCE විභාගයට පෙනී සිටීමට නියමිත් ඇයත් විභාග විෂයක් ලෙස සිංහල භාෂාව තෝරාගෙන සිටින සිසුවියක්.

ඕස්ට්‍රේලියාවේදී ඉපිද, මෙහිදීම බහ තෝරා හැදී වැඩුන දියණියක් ලෙස, රොක්ස්බර්ග්පාක් සිංහල භාෂා පාසැලේදී VCE විභාගය සඳහා සිංහල විෂයය හදාරන පළමුවැන්නිය ඇය වීම, මෙහි විශේෂත්වයයි.

මන්දස්මිතයකින් ඔප වැටුනු මුවින් යුතුව, මේ යොවුන් දියණිය සභාව ඇමතීමට ලත් ආරාධනය පිළිගෙන අප ඉදිරියට පැමිණුනේ පැකිලීමකින් තොරව.

පිවිතුරු සුදු අරලියා මලක් සිහිකළ ඇගේ අවිහිංසක මුහුණ, මින් පෙර යම් දිනෙක දැක හුරු පුරුදු බවක් හැඟුනා. ගිය වසරේ පාසැලේ වාර්ෂික විවිධ ප්‍රසංගයේදී මනරම් රඟුමක් ඉදිරිපත් කළ, පුංචි භාරත නළඟන ඇය ම බව මා පසක් කළේ එවිටයි. නොබිඳි සිංහලෙන් අගේට කතාකරන මේ විශිෂ්ඨ නැටුම් ශිල්පිණිය හැබෑම පුංචි හපනියක්. නිහඬ සභාගැබ අබිමුව, සසනි දුව මුදු සරින් කතාව ඇරඹුවා.

බාලවියේ සිටම තමන් සිංහලෙන් කථා කළ හැටි, නොකඩවා සිංහල භාෂා පාසැලට ආ හැටි, දෙමාපිය නෑදෑ හිතවතුන් ගෙන් සිංහල දැනුම දියුණු කර ගැනීමට උදව් ලැබුන හැටි, ඇය විස්තර කළේ ඉතාම හුරුබුහුටිව.

සභාවේ පසෙක සිට ඇය දෙස නෙත් යොමා සිටි, මේ දැරියගේ ආදරණීය දෙමාපියන්, වෙත මගේ දෑස යෙ-ාමුවුනේ නිතැතින්ම. සතුටු කඳුළු උතුරා ගිය වතින් යුතු ඒ දෙපළගේ දසුන අප කාගේත් සිත් වලට ගෙන ආවේ පහන හැඟීමක්. අම්මා කෙනෙකුට, තාත්තා කෙනෙකුට දරුවෙකුගේ යහපත තරම් සතුටක් තවත් තිබෙනවාද? ඇයට යහමඟ පෙන්වන ඇගේ දයාබර මාපිය දෙපලටත්, අපේ ආශිර්වාදය හිමිවිය යුතුයි.

ඉදිරිපස අසුනක තවත් යුග දෑසක් සතුටු කඳුළින් පිරී දිලිසුනා. සසනි දුව ව සභාවට හඳුන්වා දුන් ඇගේ දයාබර ගුරු මෑණියන්ගේ දෑසේ එසේ පැහැදිලිව සනි-ටුහන් වී තිබුනේ සිප් කිරෙන් පෝෂිත සිසු දියණියකගේ උදානය අබියස හදවතට දැනුනු සැබෑ සතුටයි.

සිංහලෙන් කතාව නුහුරු, සිංහලෙන් කතාවට මැළි කරන යම් යම් අප දුවා දරුවන්ටත් ඒ තත්වයෙන් දරුවන් අත් මිදවීම තමා සතු කාර්යය භාරයක් සේ නොසිතන දෙමාපියන්ටත් සසනි දුව සැපයුවේ හැබෑම පරමාදර්ශයක්.

සිංහල භාෂා ඥාණය නම් වූ මහඟු දායාදය අප මතු පරම්පරා වලටද උරුම කිරීමේ යුතුකම, වගකීම හා කාර්යය භාරය ඔස්සේ බොහෝ දුරට සිතන්නට අරුත්බර සිතුවිලි රැසක් සිත් සතන් තුළ ඉතිරි කළ, මේ සුහද දෙමාපිය - ගුරු රැස්වීමේ මතක සටහන් අතරට, සසනී දියණිය සිය කතාව අවසානයේ සෙසු ලාබාල සහෝදර සිසු කැළ අමතා කළ ලෙන්ගතු ඉල්ලීම ද එකතු වන්නේ නිරායාසයෙන්.

මේ ඇගේ ඒ දයාබර ඉල්ලීම.

"නංගිලා මල්ලිලාටත් මම කියන්නෙ සිංහල භාෂාව ඉගෙන ගන්න කියලා. මොකද තමන්ගේ භාෂාව ඉගෙන ගන්නවා කියන්නේ ජීවිතේට වටින දෙයක්...."

ආදරණීය දෙමව්පියනි, ඕස්ට්‍රේලියාවේ ඉපදී හැදී වැඩුණු මේ ලාබාල දියණියගේ දයාබර ඉල්ලීම දෙස ඔබේද නෙත සිත යොමු කරන්න. ඔබ දෑස වන් දූ පුතුන්ට සිංහල අධ්‍යාපනය ලබාදීමේ වටිනාකම තේරුම් ගෙන ඒ සඳහා ඔවුන් ව යොමු කරන්න.


Victoria Mercantile LAWYERS

**Commercial Litigation**
- Motor vehicle litigation (Motor vehicle accident Claims)
- Debt Recovery
- Contract Disputes

**Business & Commercial Law**
- Sale & Purchase of Business
- Partnership Agreements
- Employment Agreements
- Commercial Leases

**Wills**

**Powers of Attorney**

**Conveyancing**
- Sale & Purchases
- Contract of Sales
- Auction Contracts
- Vendor Statements
- Subdivisions

**Family Law**
- Divorce
- Property Settlements
- Pre-Nuptial Agreements
- Binding Financial Agreements
- Consent Orders

(03) 9803 6225
(03) 9803 6226
info@vicmercantilelawyers.com.au
PO Box 5358 Pinewood VIC 3149
www.vicmercantilelawyers.com.au

Anne Heenatimulla LLM (Monash)
Principal
Barrister & Solicitor


රටවල් 40ක සිට ශ්‍රී ලාංකිකයන් අසන ගුවන්විදුලිය - තිසර www.thisara.com